පන්තිය: 12

විෂය: ජීව විද්‍යාව

සතිය: ඔක්තෝබර් 16-23

1.ඒකකය : ශාක ආකාරය හා ක්‍රියාකාරීත්වය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදෑරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=549

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=447#section-4

https://youtu.be/RILMkBzeWX8?list=PLlyv4_Vxwl-xzFEqsZxoEqnkKS2ZObUo0

https://youtu.be/GpCAsFu-c3U?list=PLlyv4_Vxwl-xzFEqsZxoEqnkKS2ZObUo0

4.ඉගෙනුම් ඵල

දර්ශීය ද්විබීජ පත්‍රි ශාක පත්‍රයක පටකීය ව්‍යූහය කෙටියෙන් පැහැදිලි කරයි.

- දර්ශීය ඒකබීජ පත්‍රි ශාක පත්‍රයක හා ද්විබීජ පත්‍රි ශාක පත්‍රයක ප්‍රධාන ව්‍යූහ වෙනස් කම් ප්‍රකාශ කරයි. පූටිකා සහ වාසිදුරු ප්‍රධාන වායු හුවමාරු ව්‍යූහ ලෙස නම් කරයි.
- ප්‍රධාන වායු හුවමාරු ව්‍යූහ ලෙස ශාක පත්‍රයක් සතු ලක්ෂණ හඳුනාගනියි.
- පූටිකාවක ව්‍යූහය එහි කෘත්‍යයන්ට අදාළ විස්තර කරයි.
- K+ සාන්ද්‍රය භාවිතයෙන් පූටිකාවක විවෘත වීමේ හා වැසීමේ යන්ත්‍රණය කෙටියෙන් විස්තර කරයි.
- පූටිකාවක විවෘත වීමේ හා වැසීමේ යන්ත්‍රණය සඳහා බලපාන සාදක කෙටියෙන් විස්තර කරයි (ආලෝකය, අධඃ පූටිකා අවකාශය, CO2 සාන්ද්‍රණය, නියගය, ඉහළ උෂ්ණත්වය, සුළඟ, ABA නිෂ්පාදනය)
- අන්වීක්ෂය භාවිතයෙන් පූටිකාවක හා වා සිදුරක ව්‍යූහය හඳුනාගනියි ශාකවල ජලය හා ඛණිජ පරිවහනයේ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- ජලය හා ඛනිජ පරිවහනය වන ප්‍රධාන ක්‍රම ලෙස විසරණය, ආස්‍රැතිය හා නිපානය නම් කරයි.
- ජල විභව සංකල්පය කෙටියෙන් විස්තර කරයි.
- ද්‍රාව්‍ය විභවය හා පීඩන විභවය යන සංකල්ප පැහැදිලි කරමින් ජල විභව සමීකරණය ඉදිරිපත් කරයි උප අභිසාරක, උපරි අභිසාරක හා සමාභිසාරක ද්‍රාවණ තුළ දී ඡේබිත ශාක සෛලයක ජල විභව සංරචකය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- පාංශු ද්‍රාවණයේ සිට මූලකේශයට ජලය අවශෝෂණය වීම හා ඛනිජ අවශෝෂණය වීම් අතර වෙනස විස්තර කරයි.
- ශාක මූලක ඇපොප්ලාස්ට මාර්ගය, සිම්ප්ලාස්ට මාර්ගය හා (පටල හරහා සම්ප්‍රේෂණය මාර්ගය) ඔස්සේ සිදු වන අරීය පරිවහන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරයි.
- ශාකයේ උඩුකුරු ජල පරිවහනය පැහැදිලි කිරීමට සංසක්ති ආසක්ති ආතතිවාදය ඉදිරිපත් කරයි.
- ජල විභවය නිර්ණය කිරීමේ පරීක්ෂණයේ මූලධර්මය සාකච්ඡා කරයි.
- අර්තාපල් ආකන්ධ හෝ හබරල පත්‍ර වෘන්තවල ජල විභවය නිර්ණය කිරීමේ පරීක්ෂණ සිදු කරයි.
- *Tradescantia (Rhoeo)* අපිචර්මීය සිවිවල ද්‍රාව්‍ය විභවය නිර්ණය කිරීමට පරීක්ෂණ සිදු කරයි.